දේශීය ආදාය දෙපාර්තමේන්තුව
உள்நாட்டு இறைவரித் திணைக்களம்
INLAND REVENUE DEPARTMENT

ලේකම් අංශය
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 02
ශ්‍රී ලංකාව
දුරකථන :- 011-2334400/011-2135400
ෆැක්ස් :- 011-2337777

செயலகம்
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு 02
இலங்கை
தொலைபேசி :- 011-2334400/011-2135400
பக்ஸ் :- 011-2337777

Secretariat
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 02
Sri Lanka
Telephone :- 011-2334400/011-2135400
Fax :- 011-2337777

E-Mail : cgir@ird.gov.lk Web: www.ird.gov.lk

මගේ අංකය: CGIR/2019/03 - 1(Ins. & Cir)  09.07.2019

**අමාත්‍යාංශ ලේකම්වරුන්,**

**පළාත් ප්‍රධාන ලේකම්වරුන්,**

**දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්,**

**දෙපාර්තමේන්තු ප්‍රධානීන්,**

**ප්‍රධාන ගණකාධිකාරීවරුන්,**

**සංස්ථා,ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය ව්‍යවසාය ආයතන ප්‍රධානීන්,**

**<u>සැපයුම්කරුවන් වෙත එකතු කළ අගය මත බද්ද (VAT) ගෙවීම.</u>**

රාජ්‍ය ආයතන සහ රජයට අයත් ආයතන විසින් සැපයුම්කරුවන් වෙත ගෙවීම් කිරීමේදී එම ගෙවීම් මත අදාල VAT මුදල, අක්‍රිය බදුගෙවන්නන් සහ තාවකාලික VAT ලියාපදිංචි පුද්ගලයන් වෙත ගෙවීම් කර ඇති බව මා වෙත නිරීක්ෂණය වී ඇත. මේ මගින් රාජ්‍ය ආදායම එකතු කර ගැනීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉමහත් දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වී ඇත. එසේ ගෙවන ලද VAT මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකර රජයට ලැබිය යුතු ආදායම වෙනත් පුද්ගලයන් රඳවාගෙන ඇත. එබැවින් සැපයුම්කරුවන් වෙත VAT මුදල ගෙවීමේදී පහත කරුණු කෙරෙහි ඔබගේ දැඩි අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමි.

1. සැපයුම්කරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංකයක් (TIN) ලබා ගෙන ඇති බවට එම සහතිකය මගින් තහවුරු කර ගත යුතු අතර VAT සඳහාද ලියාපදිංචිය ලබාගෙන තිබිය යුතුය.
2. ස්ථිර VAT ලියාපදිංචි තැනැත්තන් සඳහා TIN අගට 7000 උප අංකය ඇතුළත් වේ. VAT සඳහා ස්ථිර ලියාපදිංචිය ලබා තිබුනද සැපයුම්කරු ක්‍රියාකාරී බදු ගෙවන්නෙකු (Active) බවට ද සහතික කර ගත යුතුය.
3. TIN හි අග 2525 උප අංකය සඳහන් වන්නේ නම් එය තාවකාලික ලියාපදිංචියක් වේ. එවැනි තැනැත්තන්ට VAT ගෙවීම සිදු නොකළ යුතුය.
4. ඒ අනුව ස්ථිර VAT ලියාපදිංචියක් ඇති, VAT සඳහා ක්‍රියාකාරී ලිපිගොනුවක් පවත්වාගෙන යනු ලබන සැපයුම්කරුවන්ට පමණක් අදාළ VAT මුදල ගෙවිය යුතු වේ.

02. ඒ අනුව සැපයුම්කරු සම්බන්ධව ඉහත තොරතුරු සනාථ කර ගැනීම සඳහා, පහත දක්වා ඇති ක්‍රියාපිළිවෙල අනුගමනය කල හැකිය.

- **සැපයුම් අනුමැතිය ලබා දීමට පෙර,**

  I. වැට් බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තා සක්‍රිය බදු ගෙවන්නෙකුද යන්න පහත දුරකථන අංක අමතා දෙපාර්තමේන්තුව වෙතින් තහවුරු කර ගත හැකිය.

| | | | |
|---|---|---|---|
| ව්‍යාපාර උපදේශන අංශය | එම්.පී. අමරතුංග මිය | කොමසාරිස් | 0112134251<br>0112134284<br>0112134253 |
| සේවාදායක උපකාරක හා ප්‍රවර්ධන අංශය | එච්.බී.ඒ. චන්ද්‍රානි මිය | කොමසාරිස් | 0112134250<br>0112134223<br>0112134222<br>ෆැක්ස් - 2338924<br>Email – cir.csp@ird.gov.lk |

II. මීට අමතරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ Web අඩවියේ (www.ird.gov.lk) ඇතුලත් කර ඇති VAT ලිපිගොනු අක්‍රිය කරන ලද බදු ගෙවන්නන්ගේ නාම ලේඛණය මගින් වැට් බදු අංකය අක්‍රිය කරන ලද එකක්දැයි තවදුරටත් තහවුරු කර ගත හැකිය.

- ගෙවීම් කිරීමට පෙර,

  සැපයුම්කරුගේ වැට් බදු ලියාපදිංචි අංකය ක්‍රියාකාරී මට්ටමේ තිබේදැයි සනාථ කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවාදායක උපකාරක හා ප්‍රවර්ධන අංශය වෙත පහත ආකෘතියට අනුව විස්තර ඉදිරිපත් කිරීමෙන් ලිපියක් ලබාගැනීමට පහසුකම් සලසා ඇත.

| සැපයුම්කරුගේ නම | ලිපිනය | වැට් ලිපිගොනු අංකය |
|---|---|---|
| | | |

03. තවද සැපයුම්කරුවන් වෙත කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත සඳහන් ආකෘතියට අනුව සෑම කාර්තුවක් (ජනවාරි - මාර්තු/ අප්‍රේල් - ජුනි/ ජුලි - සැප්තැම්බර්/ ඔක්තෝබර් - දෙසැම්බර්) අවසන් වී ඊළඟ මාසයේ 15 දිනට පෙර ජ්‍යෙෂ්ඨ කොමසාරිස්, තොරතුරු හා අනිවාර්ය ලියාපදිංචි අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 02 ලිපිනයට හෝ cgir@ird.gov.lk ඊ මේල් ලිපිනය වෙත යොමු කරන්න.

| අනු අංකය | සැපයුම්කරුගේ නම හා ලිපිනය | ලබාගත් සැපයුමේ විස්තරය | TIN අංකය | ගෙවීම් කරන ලද දිනය | ගෙවූ මුදල | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | VAT රහිත මුදල | VAT | මුළු මුදල (VAT සහිත) |
| | | | | | | | |

නදුන් ගුරුගේ
කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ.ගාඩිනර් මාවත
කොළඹ 02.

නදුන් ගුරුගේ
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

පිටපත් -
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
1. ජ්‍යෙෂ්ඨ කොමසාරිස් - බදු උපකාරක සේවා හා පාරිභෝගික ප්‍රවර්ධන අංශය
2. ජ්‍යෙෂ්ඨ කොමසාරිස් - තොරතුරු හා අනිවාර්යය ලියාපදිංචි අංශය
3. කොමසාරිස් - ව්‍යාපාර උපදේශන අංශය
4. කොමසාරිස් - සේවාදායක උපකාරක හා ප්‍රවර්ධන අංශය
5. කොමසාරිස් - තොරතුරු අංශය